## ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ අරමුදල - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික බුද්ධිමය දේපළ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගනුදෙනුකරුවන්ගේ කාර්මික සැලසුම් සහ ලකුණ ලියාපදිංචි කිරීම සහ වෙනස් කිරීම් ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ගනුදෙනුකරුවන් වෙනුවෙන් අරමුදල ලබාගන්නා මුදල් , බැරකම් ගිණුමක රඳවා ඊට අදාල වියදම් එම ගිණුමට හර කිරීම වෙනුවට ලද මුදල් අරමුදලේ ආදායමට බැර කර තිබුණි. මේ නිසා අරමුදලේ ආදායම පිළිබඳව නිවැරදි තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශන මගින් පිළිබිඹු නොවුණි.

### 1.2.2 නිති ,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 880 හා රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය ප්‍රකාර ඇප තැබිය යුතු රජයේ නිලධාරින්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු තුළින් ජනිත වූ මූල්‍ය ප්‍රතිඵලය රු.47,715,331 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපි ඉකුත් වර්ෂයෙ අතිරික්තය රු.42,862,389 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,852,942 කින් වර්ධනය වීම සඳහා සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායම රු.මිලියන7.8 කින් වැඩිවීම විශේෂයෙන්ම බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතඵලයේ අතිරික්තය වැඩිවීම කෙරෙහි පහත සඳහන් කරුණු බලපා තිබුණි.

| විස්තරය | වර්ෂය | | මූල්‍ය ප්‍රතිඵලය | මූල්‍ය ප්‍රතිඵලයේ |
|---|---|---|---|---|
| | 2012 | 2011 | වැඩිවීම | වැඩිවීමේ ප්‍රතිශතය |
| | රු. | රු. | රු. | % |
| පේටන්ට් | 5,012,774 | 4,339,251 | 673,523 | 16 |
| ආයෝජන ආදායම් | 40,479,756 | 32,673,971 | 7,805,785 | 24 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

**වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරිම**

**සමාලෝචිත වර්ෂයේ වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම් ලියාපදිංචි කිරිමේ කාර්ය සාධනය ඉකුත් වර්ෂයේ කාර්ය සාධනය සමඟ සසඳා පහත දැක්වේ.**

| | වෙළඳ ලකුණ ලියාපදිංචිය | | පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය | | කාර්මික සැලසුම් ලියාපදිංචිය | |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2011 | 2012 | 2011 | 2012 | 2011 |
| පසගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ඉල්ලුම්පත් සංඛ්‍යාව | 22,538 | 19,864 | 1,287 | 1,081 | 823 | 573 |
| වර්ෂය තුළ ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව | 9,036 | 7,657 | 539 | 429 | 394 | 443 |
| වර්ෂය තුළ ලියාපදිංචි කළ යුතු සංඛ්‍යාව | 31,574 | 27,521 | 1,826 | 1,510 | 1,217 | 1,016 |
| වර්ෂය තුළ ලියාපදිංචි කළ සංඛ්‍යාව | 2,854 | 4,983 | 301 | 223 | 262 | 193 |
| ඉදිරි වර්ෂයට ගෙන ගිය ලියාපදිංචි නොකළ සංඛ්‍යාව | 28,720 | 22,538 | 1,525 | 1,287 | 955 | 823 |
| ලියාපදිංචියට ඉල්ලුම් කර තිබුණත් ලියාපදිංචිය නොකළ ඉල්ලුම්පත්වල ප්‍රතිශතය | 91% | 81% | 84% | 85% | 78% | 81% |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා ලැබී තිබුණු ඉල්ලුම්පත්වලින් 2012 දෙසැම්බර් 31 දිනට කිසිදු ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණු අයදුම්පත් 28,720 ක් තිබූ අතර, එය වර්ෂය තුළ ලියාපදිංචි කිරීමට තිබූ මුළු ඉල්ලුම්පත් ප්‍රමාණයෙන් සියයට 91 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ප්‍රතිශතය වූ සියයට 81 ඉක්මවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලද අයදුම්පත් ප්‍රමාණය හා සසඳන විට ඉහත සඳහන් ඉතිරි වී ඇති අයදුම්පත් ප්‍රමාණය පමණක් සම්පූර්ණ කිරීමට තවත් වසර 10 කට වඩා කාලයක් ගත වනු ඇත.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කිරීමට තිබූ මුළු පේටන්ට් බලපත්‍ර 1,896 කින් ඉල්ලුම්පත් 301 ක් ලියාපදිංචි කර තිබීම ඉකුත් වර්ෂයට වඩා ප්‍රගතියක් ලබා තිබුණත්, ඉටු කළ යුතුව තිබුණු ප්‍රමාණයෙන් එය සියයට 16 ක වැනි සුළු ප්‍රතිශතයක් ගෙන තිබුණි. අර්ධ වශයෙන්

නිමකළ හා මුළුමනින්ම අතහැර දමන ලද අයදුම්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවිණි.

(ඇ) පසුගිය වසර වලින් ඉදිරියට ගෙන ආ කාර්මික සැලසුම් අයදුම්පත් 823 ක් සහ සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු අයදුම්පත් 394 ක් වශයෙන් එකතුව අයදුම්පත් 1,217 ක් සමාලෝචිත වර්ෂය තුළ ලියාපදිංචි කිරීමට තිබූ අතර, ඉන් අයදුම්පත් 262 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. කාර්මික සැලසුම් ලියාපදිංචිය කිරීමට ඉල්ලුම්පත් 1,217 න් සමාලෝචිත වර්ෂය සඳහා ලැබී තිබුණත් අරමුදලින් ඉන් ලියාපදිංචි කර තිබුනේ සියයට 22 ක් හෙවත් ඉල්ලුම්පත් 262 ක් පමණි. අඩක් නිමකරන ලද හා අතහැර දමන ලද අයදුම්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ඉහත සඳහන් තොරතුරු අනුව වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, සහ කාර්මික සැලසුම් ලියාපදිංචිය ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ප්‍රධාන කාර්යය වුවද, එම කාර්ය ඉටු කිරීම ඉතා දුර්වල තත්ත්වයක පැවතිණි. මේ නිසා නව නිර්මාණකරුවන් අධෛර්යට පත්වීම සහ නිසි කලට ලියාපදිංචිය නොලැබීමෙන් නිර්මාණකරුවන්ගේ නව නිර්මාණ තුළින් ආර්ථිකයට වන දායකත්වය නොලැබී තිබුණි. ඉතිරි අයදුම්පත් ප්‍රමාණය කඩිනමින් ලියාපදිංචි කිරීමට උපාය මාර්ගක සහ ක්‍රියාකාර වැඩපිළිවෙලක් කෙරෙහි අරමුදල අවධානය යොමු කර නොතිබුණි

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) **සුරක්ෂිතාගාරයක් සහ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම**

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා සුරක්ෂිතාගාරයක් හා අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සහ ඒ වෙනුවෙන් වන අනෙකුත් කටයුතු සඳහා 2008 හා 2009 වර්ෂවල දී එකතුව රු. 22,978,101 ක වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අදාළ ඉඩමේ අයිතිය සහ පැවැත්ම තහවුරු කර නොගෙන ඉදිකිරීම් කර තිබුණු බැවින් ඒ සඳහා වැය කළ රු. 22,978,101 ක් වූ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ii) කොන්ත්‍රාත් සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව 2008 දෙසැම්බර් 18 දින වන විට කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතුව තිබුණත්, එය අතරමඟදී අත්හිටුවා තිබුණි.

(iii) ඉදිකිරීම් කටයුතු 2008 දෙසැම්බර් මාසයේදී අත්හිටුවීමෙන් පසු වර්ෂ දෙක හමාරක් පමණ කාලයක් ඉඩම අනාරක්ෂිතව හා ප්‍රයෝජනයට නොගෙන පැවතුණි. එකී ගොඩනැගිල්ල ඵලදායී ලෙස වෙනත් රජයේ කටයුත්තක් සඳහා හෝ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) ඉදිකිරීම් කරන ලද කොන්ත්‍රාත්කාර සමාගම වෙත අත්තිකාරම් ලෙස ගෙවන ලද මුදලින් නැවත ආපසු අයකරගත යුතු රු. 4,549,750 ක් වූ මුදල 2013 ජූනි 30 වන විට අය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **බුද්ධිමය දේපළ පහසුකම් සැපයීමේ මධ්‍යස්ථාන පිහිටුවීම**

වාර්ෂික ක්‍රියාකාර සැලැස්මට අනුව ඉහත මධ්‍යසථාන 03 ක් පිහිටුවීම සඳහා රු.මිලියන 04 ක් වෙන්කර ගෙන තිබුණද 2012 දෙසැම්බර් 31 දින වනවිටත් එකී අරමුණ කරා ළඟා වී නොතිබුණි.

## 3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) බුද්ධිමය දේපළ කාර්යාලයේ, අධ්‍යක්ෂ ජනරාල් තනතුර ඇතුළුව විධායක මට්ටමේ තනතුරු පහක් 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පුරප්පාඩුව පැවතයද, එම පුරප්පාඩු පිරවීමට 2013 මැයි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලට සුවිශේෂ වූ තනතුරු අතරින්, බුද්ධිමය දේපළ තාක්ෂණික සහකාර, බුද්ධිමය දේපළ පර්යේෂණ සහකාර, ලේඛන හා දත්ත සහකාර සහ බුද්ධිමය දේපළ නිලධාරි යන තනතුරුවල අනුමත සේවක සංඛ්‍යාව 27 කින් තනතුරු 11 ක් 2013 මැයි 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

අරමුදලේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා අරමුදල වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් සමාලෝචිත වර්ෂයද ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණි.

### 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකසා නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

මු. රෙ.133 හා 134(3) ප්‍රකාරව අරමුදලේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාතමක කර එකී විගණන වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය අරමුදලේ විගණන කටයුතුද ආවරණය කර තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය ව පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම

(ඇ) මානව සම්පත් කළමනාකරණය

(ඈ) ඉදිකිරීම් කොන්ත්‍රාත්